# මාතලේ දිස්ත්‍රික්කයේ ලොකු ළූණු වගාව

1980 දශකය ආරම්භයේ දී ලොකු ළූණු වගාව ප්‍රථම වතාවට මාතලේ දිස්ත්‍රික්කය තුළ ව්‍යාප්තවීම ආරම්භව පැවතුණි. මාතලේ දිස්ත්‍රික්කය ප්‍රධාන වශයෙන් කාලගුණික තත්ත්වය මත තෙත් සහ වියළි වශයෙන් කොටස් දෙකකට බෙදේ. මෙහි දී, වියළි කාලගුණික තත්ත්වයන් පවතින දඹුල්ල, සීගිරිය, ගලේවෙල, දේවහුව යන ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශ ආශ්‍රිත ලොකු ළූණු වගා කටයුතු වැඩි වශයෙන් පසු කාලීනව ව්‍යාප්තවීමක් දක්නට ලැබුණි. ආරම්භක වශයෙන් සීගිරිය, පලුටාව ප්‍රදේශ මූලික කරගෙන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ උපදේශකත්වය මත අක්කර 05ක් වැනි ඉතාම සුළු බිම් ප්‍රමාණයකින් මෙම වගාවේ ආරම්භය සිදු වී තිබේ. 1990 දශකයේ මැද භාගය වන විට, ලොකු ළූණු වගාව වාණිජ බෝගයක් ලෙස ජනප්‍රියත්වයට පත් විය. ලොකු ළූණු වගාවට උචිත වූ කාලගුණික තත්ත්වයන් මාතලේ දිස්ත්‍රික්කයේ පවතින නිසා 1980 දශකයේ සිට 2000 දශකය දක්වා වගා ව්‍යාප්තිය සැලකිය යුතු මට්ටමකින් ඉහළ ගියේය. වර්තමානය වන විට, දිස්ත්‍රික්කයේ ජනගහනයෙන් ගොවි පවුල් 15000ක් පමණ ප්‍රමාණයක් ලොකු ළූණු වගා කටයුතු සඳහා දයක වී සිටිති.

**වගා බිම් ප්‍රමාණය**

මාතලේ දිස්ත්‍රික්කයේ පසුගිය වසර 10 ක කාලසීමාව එනම්, 1998 සිට 2008 දක්වා කාලය තුළ දිස්ත්‍රික්කයේ ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශ අනුව වගා කටයුතු ව්‍යාප්ත වී ඇති ආකාරය වගු අංක 01 සටහන තුළින් පැහැදිලි වේ. 1998 වර්ෂයේ හෙක්. 500ක් වශයෙන් පැවති මුළු ලොකු ළූණු වගා බිම් ප්‍රමාණය 1999 වසර වන විට හෙක්. 1598 වශයෙන් 182% ප්‍රමාණයෙන් වැඩිවීමක් සිදු විය. 1998 වසරේ ඉන්දියාවේ පැවැති නියඟය නිසා විවෘත වෙළෙඳපොළේ ලොකු ළූණු මිල ඉහළ යාමත් සමඟ ඊට ප්‍රතික්‍රියාවක් වශයෙන් දේශීය වගා බිම් ප්‍රමාණය දෙගුණයකටත් වඩා වැඩි ප්‍රමාණයකින් වැඩි කිරීමට ගොවීහු පෙළඹී සිටිය හ. මාතලේ දිස්ත්‍රික්කයේ ලොකු ළූණු වගා කටයුතු ප්‍රධාන වශයෙන් යල කන්නය තුළ දී පමණක් සිදු වේ. මහ කන්නය තුළ දී වර්ෂාව වැඩි කාලගුණික තත්ත්වයක් පැවතීම මත, වී වගාව සහ එළවළු වගාවන් සඳහා එම කාලසීමාව තුළ දී වැඩි ව්‍යාප්තියක් පවතී. යල කන්නය තුළ දී, අප්‍රේල් මාසයේ අග සිට ජූලි මස මුල සති දෙක දක්වා කාලය තුළ දී වගා කටයුතු සිදු කෙරේ. මැයි මාසය තුළ දී තවාන් කටයුතුවලින් 75%ක් සිදු කර අවසන් වේ. සිටුවීම් කටයුතු වලින් 60%ක්ම ජූනි මාසය තුළ දී සිදු කෙරේ. 1999 වර්ෂයෙන් පසු වර්ෂවල දී දේශීය ලොකු ළූණු අස්වනු නෙලන කාලසීමාව තුළ දී අඩු මිලට ආනයනික ලොකු ළූණු වෙළෙඳපොළට සැපයුම්ම මත විවෘත වෙළෙඳ පොළේ තොග මිල අඩු වීමක් සිදු විය. ඊට

වගු අංක 1

**ලොකු ළූණු වගා ප්‍රමාණය (හෙක්.) ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශ අනුව**
**මාතලේ දිස්ත්‍රික්කය (1998-2008)**

| ප්‍රදේශය | 1998 | 1999 | 2000 | 2001 | 2002 | 2003 | 2004 | 2005 | 2006 | 2007 | 2008 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දඹුල්ල | 221 | 833 | 557.5 | 659.5 | 358 | 328 | 572 | 524 | 1125.5 | 1270 | 935 |
| සීගිරිය | 166 | 400 | 194 | 325 | 340 | 445 | 525 | 593 | 938.3 | 1250 | 850 |
| ගලේවෙල | 39 | 100 | 65 | 85 | 72 | 55 | 80 | 162.4 | 394.2 | 352 | 180 |
| දේවහුව | 26 | 55 | 52.5 | 68 | 31 | 60 | 10 | 32 | 161.2 | 130 | 92 |
| වෙනත් ප්‍රදේශ | 114 | 210 | - | - | - | 64.2 | 53 | 71 | 214.5 | 278 | 291 |
| එකතුව | **566** | **1598** | **869** | **1137.5** | **801** | **952.2** | **1240** | **1382.4** | **2833.7** | **3280** | **2348** |

*මූලය : සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - මාතලේ*

සාපේක්ෂව ගොවීන්ට ලැබුණ නිෂ්පාදන මිල ගණන් ද අඩු වී තිබුණි. සමහර අවස්ථාවල දී නිෂ්පාදන වියදම පවා ලබා ගැනීමට අපොහොසත් වූ අවස්ථා පැවති අතර එම මෙම හේතු මත එකී වර්ෂවල වගා ප්‍රමාණය ප්‍රධාන වශයෙන් අඩු-වැඩිවීමට එය සෘජුවම බලපා තිබුණි. මෙහි දී, 2004 වර්ෂයෙන් පසු කාලසීමාව තුළ දී, රජයේ ප්‍රතිපත්තියක් වශයෙන් දේශීය ලොකු ළූණු අස්වනු නෙලන කාලසීමාව වන අගෝස්තු, සැප්තැම්බර්, ඔක්තෝබර් යන මාස සඳහා ආනයන වශයෙන් සැපයෙන ලොකු ළූණුවලට අය කරනු ලබන තීරුබදු ප්‍රමාණය ඉහළ දැමීමක් සිදු විය. මේ තත්ත්වය මත අස්වනු නෙලන කාලසීමාව තුළ දී වුව ද, ලොකු ළූණු මිල ඉහළ මට්ටමක පැවතීමට හේතු විය. වාර්ෂිකව 2004 පසු ලොකු ළූණු වගා ප්‍රමාණය දිගින් දිගටම ඉහළ යාමට මෙම තත්ත්වය බලපා තිබුණි. 2007 වර්ෂයේ දී, පළමු වතාවට ලොකු ළූණු වගාව සඳහා 'කොළ කන දළඹුවාගේ' හානිය වැඩි වශයෙන් ව්‍යාප්ත වීමක් සිදු විය. වගාවන් විනාශවීමටත් අපේක්ෂිත අස්වනු ප්‍රමාණය අඩුවීමටත් එය බලපා තිබුණි. මෙම පළිබෝධ හානිය වළක්වා ගැනීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මහපෙන්වීම යටතේ C.I.C. සමාගමට පමණක් එම රෝගය පාලනය කිරීමට අවශ්‍ය පලිබෝධ නාශකය ආනයනය කිරීමට අවසර ලබාදීමක් සිදු විය. 2008 වර්ෂයේ දී, වගා බිම් ප්‍රමාණය 28%කින් අඩුවීමට එය හේතුවක් වී තිබුණි. ක්ෂේත්‍රය තුළ මෙම රෝග ව්‍යාප්තිය පාලනය කිරීමට හැකිවීමත් සමඟ 2009 වර්ෂයේ දී නැවතත් වගා බිම් ප්‍රමාණය 30%කින් පමණ ඉහළ යාමක් අපේක්ෂා කෙරේ.

**බීජ**

ගොවීන්ගෙන් 95%ක් තම වගා කටයුතු සඳහා ආනයනික දෙමුහුන් සහ ආනයනිත සාමාන්‍ය බීජ භාවිතා කරති. ඉතිරි 5%ක් පමණ ප්‍රමාණයක් දේශීය වශයෙන් නිෂ්පාදනය කර ගන්නට යෙදුන බීජ (දේශිය සත්‍ය බීජ) භාවිතයට ගතිති. ආනයනිත බීජ ප්‍රධාන වශයෙන් 'නාසික් රෙඩ්', 'නාථ්පූර් රෙඩ්' සහ 'ආනයන දෙමුහුන්' වර්ග වශයෙන් කොටස් තුනකට පවතී. ආනයනිත බීජවල පැලවීමේ ප්‍රතිශතය 70%ක් වන අතර දේශීය බීජ සඳහා එය 85%ක් මට්ටමේ පවතී. අක්කර 01ක් වගා කිරීම සඳහා ආනයනිත බීජ කිලෝ 03ක ප්‍රමාණයක් අවශ්‍ය වන අතර දේශීය වර්ග භාවිතා කරන ගොවි මහතුන්ට එය කිලෝ 2 1/2ක ප්‍රමාණයකින් සිදු කර ගැනීමට හැකි වේ. පසුගිය වසර 03ක පමණ කාල සීමාවක දී දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය තුළ දී දේශීය බීජ ආශ්‍රයෙන් සිදු කරනු ලබන වගාවන්ගේ නිෂ්පාදන සඳහා ඉහළ ඉල්ලුමක් පැවතීම හේතුවෙන් දේශීය බීජ නිෂ්පාදනය ඉහළ නංවාලීමට රජය මෙවර පෞද්ගලික අංශය සමඟ ද කටයුතු කර තිබේ. ආනයනිත බීජ කි. 01ක සඳහා විවෘත වෙළෙඳපොළේ රු : 1500-2500 අතර මිලක පවතින අතර දේශීය බීජ කි. 01ක වෙළෙඳපොළ වටිනාකම රු : 9000-10000 අතර මට්ටමකි. දේශීය බීජ කි. 01ක් නිෂ්පාදනය කිරීම සඳහා

වගු අංක 2

**ලොකු ළූණු නිෂ්පාදනය-මෙ.ටො. මාතලේ දිස්ත්‍රික්කය (ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශ අනුව) (2005-2008)**

| ගොවි ජන බල ප්‍රදේශය | 2005 | 2006 | 2007 | 2008 |
|---|---|---|---|---|
| දඹුල්ල | 7860 | 16983 | 22860 | 16830 |
| සීගිරිය | 8895 | 14075 | 22500 | 15300 |
| ගලේවෙල | 2436 | 5913 | 6336 | 3240 |
| දේවහුව | 480 | 2418 | 2340 | 1656 |
| වෙනත් ප්‍රදේශ | 1065 | 3219 | 4986 | 5238 |
| **එකතුව** | **20736** | **42607** | **59022** | **42264** |

*මූලය : සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - මාතලේ*

රු : 5000ක පමණ මුදලක් ගොවි මහතෙකුට වැය වේ. ආනයනිත වගී වලට සාපේක්ෂව දේශීය බීජ භාවිතා කර නිෂ්පාදනය කරනු ලබන ලොකු ළූණු කල් තබා ගැනීම ඉහළ මට්ටමක පවතී. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මහපෙන්වීම යටතේ නිෂ්පාදනය කරනු ලබන දේශීය බීජ 'දඹුළු රෙඩ්' සහ 'ගලේවෙල ලයිට් රෙඩ්' වශයෙන් හැඳින්වීමක් කරනු ලබයි. මෙයට අමතරව පෞද්ගලික අංශයේ C.I.C. සමාගම විසින් ද, දේශීය බීජ නිෂ්පාදනය කිරීමක් සිදු කරනු ලබයි.

## නිෂ්පාදනය

2005 සිට 2008 වසර දක්වා වසරවල දී මාතලේ දිස්ත්‍රික්කයේ ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශ අනුව ලොකු ළූණු නිෂ්පාදනය වගු අංක 02 න් දැක් වේ. 2005 වර්ෂයේ දී මෙ.ටො. 20736ක ප්‍රමාණයක් යල කන්නය තුළ දී නිෂ්පාදනය සිදු වූ අතර 2006 වසරේ දී එම තත්ත්වය දෙගුණයකින් ඉහළ ගොස් තිබේ. පසුගිය වසර වන විට මෙම තත්ත්වය මෙ.ටො. 40000 මට්ටමට ඉහළ ගොස් තිබේ. මේ අනුව, වාර්ෂිකව ලොකු ළූණු අවශ්‍යතාවයෙන් දේශීය වශයෙන් නිෂ්පාදනය කෙරෙන ප්‍රමාණය ඉහළ නංවාලීමට පසුගිය වසර 05 ක කාල සීමාව තුළ හැකි වී ඇත. ලොකු ළූණු වගාව සම්බන්ධයෙන් ගොවීන්ගේ අත්දැකීම් ද, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දායකත්වය වැඩිවීම ද, රජයේ පොහොර සහනාධාරය ලොකු ළූණු වගාව සඳහා ලබාදීම ද යන කරුණු මත මෙම නිෂ්පාදනය වැඩි වී තිබේ. ලොකු ළූණු වගාවන්ගේ නිෂ්පාදනයෙන් 50% පමණ අස්වනු නෙලීමක් සිදු කරනු ලබන්නේ සැප්තැම්බර් මාසය තුළ දී ය.

## නිෂ්පාදන වියදම

2008 වසරේ යල කන්නය තුළ දී දේශීය වශයෙන් ලොකු ළූණු කි. 01ක් නිෂ්පාදනය කිරීමට ගොවි මහතෙකුට රු : 24.15ක් වැය වී ඇති අතර අක්කර එකක් සඳහා ඒ අනුව රු : 217349ක මුදලක් සම්පූර්ණ වශයෙන් වැය වී තිබේ (වගු අංක 3 සහ 4). පසුගිය වසර 06ක නිෂ්පාදන වියදම් සැලකිල්ලට ගැනීමේ දී, 2003 - 2006 දක්වා වසර 04ක කාලය තුළ නිෂ්පාදන වියදම බොහෝ දුරට ඉතාමත් සුළු ප්‍රතිශතයන්ගෙන් ඉහළ ගොස් තිබුණි. 2006 සිට 2007 දක්වා වසරක කාලය තුළ නිෂ්පාදන වියදම ඉහළ යාම 38%කි. 2008 වසර වන විට ද, එය 2007ට සාපේක්ෂව 95% කින් ඉහළ ගොස් තිබුණි. ශ්‍රම වියදම, පොහොර හා කෘමිනාශක, ඉන්ධන හා බීජ මිල, ට්‍රැක්ටර් ගාස්තු ඉහළ යාම මෙයට ප්‍රධාන වශයෙන් බලපා තිබේ. අක්කර එකකින් ලබා ගන්නා නිෂ්පාදනය ද, 2008 වසර වන විට ක්‍රමිකව ඉහළ ගොස් තිබුණි. වගා කටයුතු සම්බන්ධව අත්දැකීම් බහුලවීම, තාක්ෂණික ක්‍රම වැඩි වශයෙන් භාවිතා කිරීම, ආනයනික මුහුන් බීජ වගී හා දේශීය වශයෙන් උසස් තත්ත්වයේ බීජ භාවිතයට ගොවීන් නැඹුරුවීම මේ සඳහා බලපා ඇත.

## ගබඩා කිරීම

මාතලේ දිස්ත්‍රික්කයේ ප්‍රධාන ලොකු ළූණු නිෂ්පාදන ප්‍රදේශ අනුව ගබඩා කිරීමේ ක්‍රම ද වෙනස් වේ. ප්‍රධාන වශයෙන් ගබඩා කිරීමේ ක්‍රම 03ක් භාවිතා කරනු ලැබේ. එනම්,

i. තට්ටු ක්‍රමය
ii. ගස්පිටින් එල්ලීම
iii. බිම ඇතිරීම

බහුතරයක් ගොවීහු තට්ටු ක්‍රමය භාවිතා කිරීමට පෙළඹී සිටිති. පසුගිය වසර 03ක කාලය තුළ මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙතින් ගබඩා ඉදි කිරීම සඳහා අවශ්‍ය කටයුතු සලස්වාදීම මත ගබඩා කිරීමේ ප්‍රතිශතය ද ඉහළ ගොස් තිබේ. අගෝස්තු සහ සැප්තැම්බර් යන මාසවල දී අස්වනු නෙලන ලද වගාවෙන් 40%ත් 50%ත් අතර ප්‍රමාණයක් මාස 02ක් වැනි

වගු අංක 3


**ලොකු ළූණු කි. 01ක නිෂ්පාදන වියදම මාතලේ දිස්ත්‍රික්කය**
**2003 - 2008**

| | 2003 | 2004 | 2005 | 2006 | 2007 | 2008 |
|---|---|---|---|---|---|---|
| කිලෝ 01 ක නිෂ්පාදන වියදම (රු.) | 14.44 | 14.57 | 14.87 | 15.98 | 22.05 | 24.15 |

*මූලය : අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.ගො.ප.පු. ආයතනය*

රූප සටහන

**ලොකු ළූණු අලෙවි රටාව**




කාලසීමාවක් දක්වා ගබඩා කිරීමට ගොවීහු කටයුතු කරති. මාස 02ක් වැනි කාලයක් දක්වා ගබඩා කිරීමේ දී 30%ක හානියක් සිදු වේ. බර අඩුවීම හා කුණුවීම වශයෙන් මේ තත්ත්වය ඇති වේ. ගබඩාවේ ස්වරූපයත් ලොකු ළූණුවල අස්වනු නෙලන මොහොතේ පවතින ගුණාත්මක තත්ත්වයත් මේ සඳහා ප්‍රධාන වශයෙන් බල පැවැත්වේ.

**අලෙවිය සහ මිල**

මාතලේ දිස්ත්‍රික්කයේ ප්‍රධාන ලොකු ළූණු අලෙවි මධ්‍යස්ථානය බවට 'දඹුල්ල විශේෂ ආර්ථික මධ්‍යස්ථානය' පත්ව තිබේ. දිස්ත්‍රික්කය තුළ නිෂ්පාදනය වන මුළු ලොකු ළූණු නිෂ්පාදනයෙන් 90%ක්ම මෙම ආර්ථික මධ්‍යස්ථානය වෙතට සැපයේ. සුළු ප්‍රමාණයක් නිෂ්පාදන ප්‍රදේශ වෙතින් ම කොළඹ වෙළෙඳ පොළට වෙතට ද සැපයීම සිදු වේ. ලොකු ළූණු නිෂ්පාදකයාගේ සිට අලෙවි රටාව රූපසටහන තුළින් දක් වේ. 2005 වසරෙන් පසු කාලසීමාව තුළ දී ලොකු ළූණු අලෙවියේ දී ප්‍රධාන වශයෙන් ඇතිවන මිල පහත වැටීමේ අවදානම සැලකිය යුතු වශයෙන් අඩු වී තිබේ. මෙයට හේතු වී

වගු අංක 4

**ලොකු ළූණු අක්කර 01ක් වගා කිරීමට වැය වන වියදම සහ ආදයම.**
**මාතලේ දිස්ත්‍රික්කය (2008 යල කන්නය)**

| | වියදම් වර්ගය | | | මුළු වියදම (රුපියල්) |
|---|---|---|---|---|
| 1. | ශ්‍රමය | | | 79800 |
| 2. | ද්‍රව්‍ය වියදම | | | 96049 |
| | | පොහොර | රු. 36431 | |
| | | කෘමිනාශක | රු. 23389 | |
| | | ඉන්ධන | රු. 31879 | |
| | | බීජ | රු. 4350 | |
| 3. | ට්‍රැක්ටර් ගාස්තු | | | 10,000 |
| 4. | බිම් කුලිය | | | 8000 |
| 5. | ප්‍රවාහන වියදම් | | | 3500 |
| 6. | වතුර මැෂින් නඩත්තු වියදම් | | | 3500 |
| 7. | අමතර වියදම් | | | 3000 |
| 8. | අස්වනු නෙළීම | | | 13500 |
| | **මුළු වියදම** | | | **217349** |
| 9. | කි. 1 ක සාමාන්‍ය වියදම | | | 24.15 |
| 10. | අක්. 1 ක සාමාන්‍ය ඵලදාව (කි.) | | | 9000 |
| 11. | කි. 1 ක සාමාන්‍ය මිල | | | 30 |
| 12. | දළ ආදායම | | | 270000 |
| | **ලාභය** | | | **52651** |

*මූලය : සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - මාතලේ*

ඇත්තේ රාජ්‍ය ප්‍රතිපත්තියක් වශයෙන් දේශීය ලොකු ළූණු අස්වනු නෙලන කාලසීමාවන් වල දී ආනයනික ලොකු ළූණු සඳහා අය කරනු ලබන බදු ප්‍රමාණය ඉහළ දැමීමයි. මේ නිසා ආනයනික තොග වෙළෙඳපොළට සැපයුම හීනවීම හේතුවෙන් දේශීය නිෂ්පාදන සඳහා වෙළෙඳපොළේ මිල රු : 25-50ක් අතර ප්‍රමාණයක (අස්වනු නෙලන අවස්ථාවන්වල දී) මිල හැසිරවීම දක්නට ලැබේ. ගොවීන් වැඩි වශයෙන් ලොකු ළූණු වගා කිරීම සඳහා නැඹුරුවීමට මෙය ප්‍රධාන වශයෙන් බලපා තිබේ. ශ්‍රී ලංකාවේ ලොකු ළූණු අවශ්‍යතාවය දේශීය නිෂ්පාදනය හා ආනයනය කරනු ලබන ප්‍රමාණයේ එකතුවට සමාන වේ. මේ අනුව, වාර්ෂිකව මෙ.ටො. 150,000 ක අවශ්‍යතාවයක් පවතී. මෙහි දී, මාසික අවශ්‍යතාවය මෙ.ටො. 12,500ක් වන අතර වසරකට සාමාන්‍ය-යෙන් මෙ.ටො. 120,000 - 130,000ක් අතර ප්‍රමාණයක් ආනයනය කරනු ලැබේ.

## ගැටළු සහ විසඳුම්

ගොවීන්ගෙන් බහු තරයකටම තත්ත්වයෙන් උසස් බීජ නොමැතිකම ප්‍රධාන ගැටලුව බවට පත්ව තිබේ. මෑත කාලීන වසර 02ක් තුළ නිෂ්පාදන වියදම අධික ලෙස වැඩිවීම ද වගා කටයුතු ව්‍යාප්තියට අදළ ප්‍රධාන ගැටලුවක් වී තිබේ. රජයෙන් ලැබෙන සහනාධාර පොහොර ප්‍රමාණය, මේ තත්ත්වය සුළු වශයෙන් අවම කිරීමට සමත් වී සිටී. දේශීය බීජ නිෂ්පාදනය සඳහා ඉහළ පිරිවැයක් දැරීමට සිදු වීම ද, ඒ සඳහා කාලගුණික වශයෙන් ඇතිවන ස්වභාවික හානි ද ගැටළු අතර ප්‍රධාන වේ. අස්වැන්න බහුලව නෙලනු ලබන සැප්තැම්බර් මාසයේ මිල සැලකිය යුතු වශයෙන් අඩු වීම ද ගැටළුවක්ව පවතී. ගබඩා කිරීම් කටයුතු සිදු කිරීම සඳහා ගොවීන් වැඩි වශයෙන් නැඹුරු කිරීම මත මේ තත්ත්වය ද වර්තමානය වන විට පාලනය කර ගැනීමට හැකි වී තිබේ. ලොකු ළූණු බීජ අවශ්‍යතාවය ගැන සැලකිලිමත් වීමේ දී දේශීය බීජ නිෂ්පාදනයට වැඩි වශයෙන් ගොවීන් දයක කර ගැනීම ගැටළු අවම කර ගැනීමට හේතුවක් වේ. ඊට අමතරව ඵලදායීතාවය ඉහළ නංවාලීමේ තාක්‍ෂණික ක්‍රම වැඩි වශයෙන් භාවිතයට යොමු කිරීම ද වගාවේ ප්‍රවර්ධනයට හේතු වනු නිසැක ය.

**ජේ.සී.කේ.බී. ලයනල්**
සංඛ්‍යාන සහකාර (ගොවිජන සේවා මධ්‍යස්ථානය - දඹුල්ල)
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා
පුහුණු කිරීමේ ආයතනය

## මට හිතෙන හැටි ......

"මගේ ඔළුව කුරුවල් වෙලා වාගෙ ..."
ඇයි මට එහෙම හිතෙන්නේ ....
කරන කියන වැඩක් හරියට කර ගන්නත් බෑ ....
කාගේ වැරැද්දක් ද මන්ද ...
ඉරට හඳට සාප කරල හරි යනවා යැ ...
ඉර හඳ ගහ කොළ නැතුව ජීවත් වෙන්නෙ කොහොම ද ?
ඒත් ..... හිත කීරි ගැහිලා ගියාම ඕවා මතක් වෙනවා යැ ...
මට හිතෙන හැටියට පිවත් වෙන්න පිහිට වෙන ඉර හඳට කවදවත් ම බණින්න හොඳ නෑ
ඒ විතරක් නෙවෙයි
ඒ ගැන කිසිම අහිතක් හිතන්නත් හොඳ නෑ.
හෙටත් වැවට උඩින් ඉර පායයි නේ .... එතකන් මම බලාගෙන ඉන්නවා.
දැන් මට හරි සනීපයක්නෙ දැනෙන්නේ ....



- සනිජ නෙත්විරු -